# ගතවූ වසරක සටහන්.....!




**ශ්‍රී ලංකාවේ තැනුණු ප්‍රථම වේගවත් මාවත එනම් දක්ෂිණ ලංකා අධිවේගී මාර්ගය පසු ගිය වසරේ නොවැම්බර් මස අගදී විවෘත විය. සැතපුම් 78 ක් (කිමී 126 ක්) දීර්ඝ එම නව මාවත කොළඹ කොට්ටාවේ සිට ගාල්ල පින්නදූව දක්වා දිවෙයි. එම දුර දැන් පැය එක හමාරකින් යා හැකි ය. එයට වැයවූ මුදල ඩොලර් මිලියන 600 ක් බව කියති.**

## සංවර්ධනාත්මක වැඩ

පසුගිය වසරේ ශ්‍රීලංකාවේ සිදුවූ ප්‍රධානතම කායර්‍ය නම් උතුරේ සහ නැගණහිර අත් අඩංගුවටගත් කොටි සාමාජිකසාමාජිකාවන් රාශියක් පුනරුත්ථාපනය කිරීමේ කාර්යයි. රජය හා ආරක්ෂක හමුදා එම කාර්යය සාර්ථකව ඉටුකළ බවට තොරතුරු ලැබිණ.

ත්‍රස්තවාදය පරාජයකිරීමේ ලංකා අත්දැකීම් කියා පෑ කොළඹ පැවති සමුළුව තවත් විශේෂ කාර්යයක් වශයෙන් දැක්විය හැකිය. එය රටවල් 40 කින් පමණ පැමිණි නිරීක්ෂකයින්ගෙන් සමන්විත වූ අතර ශ්‍රීලංකාවට ලෝකයේ ඇතැම් රටවලින් එල්ලවූ සුදුකොඩි චෝදනාවට එය හොඳ පිළිතුරක් වූයේය.

චීනයේ ආධාර සහිතව ඉදිකළ නොරොච්චෝලේ ජලවිදුලි බලාගාරය, හම්බන්තොට වරාය, දකුණේ අධිවේගී මාර්ගය සහ මෑතකදී කොළම විවෘත වූ නෙළුම්පොකුණ රඟහලද සංවර්ධන අංශයෙන් සිදුවූ විශේෂ කාර්යයෝ වෙති.

කොළඹ නගරය පිරිසිදුකර වඩා හොඳ පාරවල් තනා එය සංචාරකයින්ට වඩාත් හිතකර තැනක් කරන්නට රජය ගෙන ඇති උත්සාහයද ඉතා අගේ කළ හැකිය.

## අවුල් සහගත සිදුවීම්

ගිය වසරේ ශ්‍රීලංකාව තුළ සිදුවූ දේවල් අතරින් බොහොමයක් සතුටින් කතා කළහැකි දේවල් නොවේ. ඉන් කීපයක් මෙසේ දැක්විය හැකිය.

## විභාග ප්‍රථිඵල අනාගැනිල්ල සහ Z ලකුණු ක්‍රමය

ඉතා මෑතකදී උසස් පෙළ විභාග ප්‍රථිඵල නිකුත්කිරීමේදී සිදුවූ විකාර තත්වය මෙසේය. උසස් පෙළ ප්‍රථිපළ මේතාක් විභාග දෙපාර්තමේන්තුව සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම මගින් නිවැරදිව නිකුත් කරන ලදී. මෙවර වූ එකම වෙනස නම් සමහර ශිෂ්‍යයින් පරණ පාඨමාලාවට අනුව විභාගයට පෙනී සිටි අය වීමයි. එසේ වුවද එයට අනුරූපව ප්‍රථිඵල නිකුත් කිරීම විභාග දෙපාර්තමේන්තුවේ අයට එතරම් අවුලක් නොවේ. Z ලකුණු ක්‍රමය නම් ශිෂ්‍යයේන් විවිධ මට්ටම් යටතේ වෙනස් විභාග මණ්ඩල යටතේ පෙනී සිට උත්තර සැපයූවත් ඒ සියළු තැන්වලින් ලැබෙන ප්‍රථිපළ එකතුකොට ඒ අදාල ශිෂ්‍යයාගේ නම යටතට ගෙන ඒමයි.

උදාහරණයක් වශයෙන් එක්සත් රාජධානියේ උසස් පෙළ විභාගය එකිනෙකට වෙනස් මණ්ඩල තුනකින් පැවැත්වුවත් ඒ තුනේම ලකුණ් දැමීමේ ප්‍රමිතිය එකහා සමානය. මෙම ක්‍රමය නම්කර ඇත්තේ Z ලකුණු ක්‍රමයයන නම යටතේය. එම පාසැලේම ශිෂයින් එක් විභාග මණ්ඩලයක් යටතේ ඉතිහාසයද, තවත් විභාග මණ්ඩලයක් යටතේ භූගෝල විද්‍යාවද ගත්තද විභාගයට පෙනී සිටි මණ්ඩල කුමක් වුවද අවසාන ප්‍රථිඵල අවුලක් නැතිව එකට ලබාගත හැකිය. මෙය සිදුවන්නේ සංඛ්‍යාලේඛන පහසුව පිණිස Z ලකුණු ක්‍රමය යනුවෙන් නම් කර ඇති ප්‍රමිති ලකුණු ක්‍රමය යටතේය. අපේ රටේ ඇත්තේ එකම මණ්ඩලයක් පමණි. ඒ විභාග දෙපාර්තමේන්තුව පමණය.

විභාග ප්‍රථිඵල අවුල වඩාත් අවුල් සහගත වූයේ දේශපාලකයින් මේ කිසිවක් නොවිමසා ඉවක් බවක් නැතිව වළං කඩයකට පැනගත් ගොනුන් සේ විවිධ දේවල් ප්‍රකාශකරන්නට පටන්ගැනීමයි. වඩාත් සුදුසු දේ වූයේ තාක්ෂණික දැනුම ඇති අය වෙතින් සිදුවී ඇත්තේ කුමක්දැයි දැනගැනීමය. අවසානයේ මෙය සමථයකට පත් කිරීමට ජනාධිපතිවරයාට මැදිහත්වන්නට සිදුවිය. මෙවැනි තත්වයක් උද්ගත වූයේ නම්, එක්සත් රාජධානියේ නම් අධ්‍යාපන ඇමතිවරයා අදාළ බලධාරියාගෙන් අසනවා ඇත. ඔහු සිදුව ඇත්තේ කුමක් දැයි ඇමතිවරයාට පහදා දෙනවා ඇත.

ලංකාවේ ජන මාධ්‍යයේද සංවරකමක් නැතිවීම මෙහිදී තවත් අතකට බලපෑවේය. අධ්‍යාපන ඇමතිවරයා තමා ලකුණු ක්‍රමය දන්නේ නැතැයි කීවිට ඔහු සමච්චලයට ලක්කරමින් ඔහුට සිනා සුනහ. විද්‍යා තාක්ෂණය පිළිබඳ ඇමතිවරයෙක් රොකට් එකක් සාදන්නේ කෙසේදැයි තමා නොදන්නා බව කීවොත් අප ඔහුට සිනාසිය යුතුද? නැත! ලංකාවේ ජන මාධ්‍යය ගැන කතා කළොත් කිවහැක්කේ ආචාර ධර්ම පිළිබඳව ඉගෙන ගන්නට දේශපාලකයින්ට මෙන්ම ජනමාධ්‍යකරුවන්ටද තව බොහෝ දුරක් යාමට තිබෙන බවයි.

## එළවළු සහ පොල් හිඟයක්

ගිය වසරේ අප්‍රියෙල් සහ මැයි මාසවල ලංකාවේ එළවළු සහ පොල් හිඟයක් පැවතුණි. ඒ දෙවර්ගය මිළෙන් ඉතා ඉහළ ගියේය. කේරළයෙන් පොල් ගෙන්වන්ට සිදුවිය. සාමාන්‍ය ජනතාවට ඉන් වූ අපහසුතාව අති මහත්ය. රජය පැවසූයේ තෙල් මිළ ඉහළ යාම අත්‍යවශ්‍ය බඩු ගණන් යාමට හේතුව බවයි. එහෙත් ඒ සමගම නුවරඑළියේ එළවලු විකුණාගන්නට බැරුව ලොරි ගණන් විනාශකර දැමූබව පුවත්පත් වල පළවිය. වෙළඳ ඇමතිවරයා ඉතා අකාර්යක්ෂම පුද්ගලයෙකු බව මේ කාරණයේ දී පැහැදිලිව පෙනුණි.

## විශ්‍රාම වැටුප් අවුල

පුද්ගලික අංශයට විශ්‍රාම වැටුප් ක්‍රමයක් ඵළසන්නට රජයගිය වසරේ සැළසුම් කළත් එය මහා අවුලක් බවට පත්වූ අතර එයට විරෝධය පාමින් උද්ඝෝෂණය කළ කටුනායක නිදහස් වෙළඳ කලාපයේ තරුණයෙකු පොලිස් වෙඩි පහරකින් මිය ගියේය. ඒනිසාම එවකට පොලිස් පතිව සිටි මහින්ද බාලසූරිය ඉල්ලා අස්වූයේය.

## එළවළු පෙට්ටි පළහිලව්ව

මෙයද වෙළඳපළට රජය වැරදි ලෙස අත දැමීම නිසා සිදුවූවකැයි බොහෝ දෙනාගේ මතයයි. එළවළු මින්පසු ගෝනිවල නොව ප්ලාස්ටික් පෙට්ටිවල අසුරා ප්‍රවාහනය කළ යුතුයයි වෙළඳ ඇමතිවරයා නීතියක් ගෙනාවේය. එසේ නොකරන අයට දඩයක්ද නියම කරන ලදී. එයට විරෝධය පෑ උඩරට ගොවියන්ගේ වර්ජනයක හේතුවෙන් කොළඹ සහ වෙනත් නගරවල ජනතාවට එළවළු නැතිව ඉතා කරදරයකට සති කීපයක් මුහුණ දෙන්නට සිදුවිය. ගොවියෝ ජනාධිපති හමුවූහ. එම නීතිය මාස කීපයකට කල් ගියේය. හදිසියේම ගෝනිය ඉවත දැමිය යුතු යයි ඒ නීතිය ආවේ ඇමතිවරයාගේ හිතවතෙක් ප්ලාස්ටික් පෙට්ටි ගෙන්වන ව්‍යාපාරයක් අරඹා ඇති නිසායයි කතාවක්ද පැතිරිණ.

## දේශපාලක මැරවර හැසිරීම් සහ භීෂණය

ඇමති මර්වින් සිල්වා පාර්ලිමේන්තුවේත් ඉන් පිටතත් හැසිරෙන අවිනිත හැසිරීම ගැන අද ලංකාවේ නොදන්නා කෙනෙක් නැත. කැත වචනයෙන් ජනතාවට සහ විපක්ෂයේ අයට බැන වැදීමේ සිට මිනිසුන් ගස්බැඳීම සහ කම්මුලට ගැසීම දක්වා ඔහුගේ අශීලාචාරකම් රජයේ නායකයින් ඉවසා සිටින ආකාරය ඉතා පුදුම සහගතය. ඒ නිසාම මර්වින් ඔහුගේ හැසිරීමේ වෙනසක්ද නොකරයි.

දේශපාලකයින්ගේ මෘග හැසිරීමේ උච්චතම අවස්ථාව උදාවූයේ දැනට සති තුනකට පමණ පෙර නත්තල් දිනයේ තංගල්ලේ හෝටලයකදී සංචාරකයෙකුට වෙඩිතබා මරාදැමීමත් ඔහු සමග සිටි රුසියානු කාන්තාවකටද පහරදී දැඩි ශාරීරික හානි සිදුකිරීමත්ය. ඒ කාන්තාව තවමත් රෝහලේ දැඩිසත්කාර ඒකකයේ පසුවන බව සැළයි. මේ සිද්ධියට වරදකරු ලෙස අසුවී සිටින්නේ ආණ්ඩු පාක්ෂික තංගල්ල පළාත් සභා සභාපතිවරයාය. ඔහු මෙයට පෙර ද මිනීමරු චෝදනා ලබාසිටින්නෙකි.

ඉතා දරුණු දාමරිකයින් මාෆියා කාරයින් සිටින ඇමරිකාවේ හෝ ඉතාලියේ හෝ දේශපාලනයේ නියුක්තව සිටින කිසිදු කෙනෙක් මෙසේ තුවක්කු ගෙන මිනීමරමින් නිදැල්ලේ හැසිරෙන්නේ නැත. එහෙත් ශ්‍රී ලංකාවේ මිනීමරුවන්ට දේශපාලනයට එන්නටත්, ඇවිත් හිතේ හැටියට මිනීමරන්නටත් අවකාශය තිබේ.

2012 වසරත් ලැබූ මේ අවස්ථාවේ රට කරවන අය මේ කාරණා හොඳින් විමර්ශණයකර ඊට සුදුසු පිළියම් යෙදෙව්වේ නැති නම් සුබ අනාගතයකට නොව, අසුබ අගාධයකට ශ්‍රී ලංකාව වැටෙනු වලක්වන්නට කිසිසේත් නොහැකි වෙනවා ඇත.

♦ **වකුල ගුණපාල**
**Ilford Essex UK**

# දේශපාලන නායක පොර



Ranil Wickremasinghe · Karu Jayasuriya · Obama · Hilary Clinton

දේශපාලන පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක රටවල ප්‍රජාතන්ත්‍රවාදයද සමගාමීව ක්‍රියාත්මක වේ. යහපාලනය (Good Governence) ඇතිවීමටත්, මහජන මතය පිළිබිඹුවීමටත් එමගින් අවස්ථාව සැලසේ. එහෙත් දැන් දැන් දේශපාලන පක්ෂවල නායකත්වයට අභියෝග එල්ල කරමින් නායක පොරයන් ඇතිවනු දක්නට ඇත. එමනිසා ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණද, යහපාලනයන්ද, මහජන මතයන්ද සමාජයෙන් ඈත්වනු පෙනේ.

දේශපාන පක්ෂයක නායකත්වයට පත්විය යුත්තේ සාමාජිකයන්ගේ කැමැත්ත පරිදිය. ප්‍රසිද්ධියේත් අප්‍රසිද්ධියේත් නායකත්වයට අභියෝගකරන සාමාජිකයෝ හැම රටකම සිටිති.

ඇමරිකාවේ රිපබ්ලිකන් පක්ෂයේ ජනාධිපතිධූර අපේක්ෂත්වය සඳහා දැවැන්ත ඡන්ද ව්‍යාපාර දැනටමත් ආරම්භවී තිබේ. මහා බ්‍රිතාන්‍යයේ ලේබර් පක්ෂයේ (කම්කරු) නායකත්වය පිණිස සටන ගිය වසරේ පැවතුණි. ඕස්ට්‍රේලියාවේ කම්කරු පක්ෂයේ නායකත්වය වෙනස් කොට ජූලියා ගිලාඩ් නම් කාන්තාව පත්වී දැන් ඈය එහි අගමැතිනිය ද වී සිටින්නී ය.

ශ්‍රීලංකාවේද මෙවැනි නායක පොර දක්නට ඇත. ජ්‍යෝෂ්ඨතම දේශපාලන පක්ෂය වූ එක්සත් ජාතික පක්ෂයට (යූඇන්පී) නායකයෙකු තෝරාගැනීමට පසුගිය දා රහසිගත ඡන්දයක් පවා පැවැත්විය. ජනතා විමුක්ති පෙරමුණේ නායකත්වයට අභියෝග කළ කණ්ඩායමට පක්ෂයේ සාමාජිකත්වය පවා අහිමිවීමේ තර්ජනයක්ට මුහුණ දී ඇත.

තම සාමාජිකයන්ගෙන් මතුවන විරෝධතා තේරුම්ගැනීමේ අපහසුතාවය බොහෝ දේශපාලන නායකත්වයන්ට ඇත. එසේම කිසිදු නායකයෙකුට ඉල්ලා අස්වීමේ හෝ වෙනත් කෙනෙකුට නායකත්වය පැවරීමේ ගුණාංගය ද නැත. තමා වඩාත් නිවැරදිය යන මතයේ එල්බ සිටීම නායක පොර ඇතිවීමට ප්‍රධාන හේතුවයි.

එක්සත් ජාත්ක පක්ෂයේ නායක පොරය 1994 අගෝස්තු මාසයේද ඇතිවිය. එවකට පක්ෂ නායකත්වයේ සිටි ඩී. බී. විජේතුංග ජනාධිපතිවරයාට අවශ්‍ය වූයේ තමා විශ්‍රාම ගොස් අනුප්‍රාප්තිකයෙකු පත්කිරීමටය. ඒ සඳහා වඩාත් නිල සුදුසුකම තිබුණේ හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතාටය. එහෙත් තවත් ජ්‍යෂ්ඨයෙකු වන ගාමිණී දිසානායක මහතාටද නායකත්වයට පත්වීමට අවශ්‍ය වූයෙන් නායක පොරයක් ඇතිවුණි. එය විසඳීමේ පළමු පියවර ලෙස පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ නායකයෙකු තෝරාගැනීමට සිදුවිය. ඒ සඳහා පැවති රහස් ඡන්දයෙන් ගාමිණී දිසානායක මහතා ජයගෙන විරුද්ධ පක්ෂයේ නායකයාද වෙමින් පක්ෂයේ නායකත්වයට පත්වීය.

1952 මාර්තු 22 දින ඩී. ඇස්. සේනානායක අග්‍රාමාත්‍යවරයා මියයාමෙන් පසුව අග්‍රාමාත්‍ය ධූරයට පත්වුණු ඩඩ්ලි සේනානායක මහතාට එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය හිමිවීය. මෙය නොයිවසූ පක්ෂයේ ජ්‍යෝෂ්ඨතමයා වූ සර් ජෝන් කොතලාවල මහතා නායක පොරයට අවතීර්ණ වූයේය. එම හැලහැප්පිලි විග්‍රහකරමින් පසු කලෙක 'අගමැති පොරය' නමින් පොතක්ද රහසිගතව ප්‍රකාශයට පත්විණ.

1997 ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ ලේකම්වරයාව සිටි ධර්මසිරි සේනානායක මහතා මියයාමෙන් පසුව පක්ෂයේ ලේකම් ධූරය සඳහා නායක පොරයක් ඇතිවිය. එවකටත් පක්ෂයේ උප ලේකම්වරයාව සිටි මෛත්‍රීපාල සිරිසේන මහතාට අභියෝග කළේ එස්. බී. දිසානායක ඇමතිවරයාය. මේ සඳහා පැවති රහස් ඡන්දයෙන් එස්. බී. දිසානායක ජයගත් අතර නායක පොරය සමනය කිරීම පිණිස මෛත්‍රීපාල සිරිසේන උපලේකම්වරයා ලෙස පත්කරනු ලැබිණ.

1959 සැප්තැම්බර් 26 වන දින එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ඝාතනය කිරීමෙන් පසුව ශ්‍රීලංකා නිදහස් පක්ෂයේ නායක පොරයෙන් විජයානන්ද දහනායක මහතා අගමැතිවීමෙන් පොරයේ ජයද හිමිකරගත්තේය.

සිරිමා බණ්ඩාරනායක මහත්මියගේ නායකත්වයට වරක් අභියෝග කළ මෛත්‍රීපාල සේනානායක මහතා මෛත්‍රී පිළ නමින් වෙනම කණ්ඩායමක්ද බිහි කළේය.

ඩඩ්ලිගේ නායකත්වයට එරෙහිව ජේ. ආර්. වරක් අධිකරණයේ පිහිටද පැතුවේය.

මහා බ්‍රිතාන්‍යයේ ලේබර් පක්ෂයේ නායකත්වය සඳහා සටන් කළේ එඩ් මිලිබෑන්ඩ් සහ ඩේවිඩ් මිලිබෑන්ඩ් යන දෙසොහොයුරන් වුවද ඡන්දයෙන් එඩ් මිලිබෑන්ඩ් දිනූ අතර ඉන් පසුව දැන් ඔවුන් දෙදෙන සහයෝගයෙන් වැඩකරන බව පෙනේ.

ඇමරිකාවේ ජනාධිපති බැරක් ඔබාමාට එරෙහිව පක්ෂයේ නාමයෝජනා ඉල්ලා තරඟ වැදුණේ හිලරි ක්ලින්ටන් මහත්මියයි. එම සටනින් හිලරි පැරදුනද ඔබාමා ජනපති පදවියට පත්වීමෙන් පසුව ඇමරිකාවේ වැදගත්ම රාජ්‍ය නිලධූරය වන රාජ්‍ය ලේකම් ධූරය ඇයට පැවරුවේය.

ඉන්දියාවේ පාලක කොන්ග්‍රස් පක්ෂයේ නායිකාව සෝනියා ගාන්ධි මහත්මිය නිසා අගමැති ධූරය හිමිවිය යුත්තේ ඇයටය. එහෙත් ඉන්දියාවේ දේශපාලන රටාවට ගරුකරමින් මනමෝහන් සිං ට අගමැති ධූරය පැවරීමට තරම් සෝනියා ගාන්ධි නිහතමානී වූවා ය.

දේශපාලන නායක පොර ඇති නොවීමට නම් දේශපාලන නායකයන් ගුණාංග කීපයක් පෙන්නුම් කළ යුතුය.

1. අවශ්‍ය වූ විට නායකත්වය අත්හැරීම.
2. පාක්ෂික සාමාජිකයන්ගේ අදහස්වලට ගරුකිරීම.
3. පසුපෙළ නායකයන් පුහුණු කිරීම.
4. නායකත්වයට වඩාත් සුදුස්සා කවුරුදැයි හඳුනා ගැනීම හා වටහා ගැනීම.

මේ නුදුරු අතීතයේ ශ්‍රීලංකාවේ පනාමුරේ වනාන්තරයේ විසූ පනාමුරේ ඇත්රාජයා තම රැළේ සාමාජිකයන් බේරාගැන්ම සඳහා එඩිතරව සටන් කොට මරණයට පත්වූ බව කියැවේ. එදා එසේ සාමාජිකයන් බේරාගැන්මට නායකත්වය ඉදිරිපත් වුවද, අද නායකත්වය බේරා ගැන්මට සාමාජකයන්ට ඉදිරිපත්වීමට සිදුවීම දෛවයේ සරදමක් නොවේද ?

**ශ්‍රීලංකා පාර්ලිමේන්තුවේ හිටපු නියෝජ්‍ය වේත්‍රධාරි**
♦ **මේජර් වී. බී. කරුණාරත්න**
**Major V. B. Karunaratne -Oxford - UK**